කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

මානවශාස්ත්‍ර පීඨය

**සිංහල**

**පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය- SINH 18224**

පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස

01. අ) පහත දැක්වෙන උද්ධෘතයේ අර්ථය ලිහිල් බසින් ලියා, එහි අවස්ථා සම්බන්ධය පැහැදිලි කරන්න.

බෝධිසත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල්යවා නොයන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතුය" යි තුමූ එතනට ගොස් දෙදෙනා ම විලට බට පියවර සටහන් දැක "මේ විල රාක්ෂසයකු අධිගෘහිත විලක් වුව මැනවැ"යි සිතා කඩුව උරයේ එල්වා ගෙන දුන්න නගා දුනු මිට හීය ලා ගෙන සිටියාහු ය. දිය රකුසු බෝධිසත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නා පියා පැන් බී නෙළුම්බල හා නෙළුබුදැලි කා මල් පැළඳ සැප සේ නොයවු දැ" යි කිවූ ය.

බෝධිසත්වයෝ ඔහු දැක සිතන්නාහු "මොහු යක්ෂයා විය යුතුය. මොහු විසින් මාගේ මල් දෙන්නා අල්වා ගන්නා ලද්දෝ වනැ" යි සිතා "තෝ මාගේ මලුන් අල්වා ගත්තෙහි දැ" කිවූ ය. "එසේය, මා ඇල්වූයෙමි" යි කී කල්හි "කවර කාරණයකින් දැ" යි විචාරා "මම විලට බට කෙනෙකුන් කන්ට ලබමි" යි කී කල්හි "කිමෙක් ද? තෝ සියල්ලවුන් ම කන්ට ලබන්නෙහි දැ" යි විචාරා "යමෙක් දේව ධර්මය දනී නම් ඔහු හැර සෙස්සවුන් කන්ට ලබමි" යි කී කල්හි "තට දේව ධර්මයෙන් ප්‍රයෝජන ඇද්දැ" යි විචාළෝය. "එසේය, දේව ධර්මයෙන් ප්‍රයෝජන ඇතැ"යි දිය රකුසු කීය. "එසේ වී නම් මම තට දේව ධර්මය කියමි" යි කිවූ ය. එබස් අසා දිය රකුසු "එසේ වී නම් කිව මැනව, මම දේව ධර්මය අසමි" යි කීය. බෝධිසත්වයෝ "මම තට දේව ධර්මය කියමි. බල එකෙක් ඇත කිලුටු ව සිටි හෙයින් මඳක් මැළියෙමි " යි කිවූ ය. උදක රාක්ෂසයා බෝධිසත්වයන් නහවා පැන් පොවා මල් පලඳවා සුවඳ විලවුන් ගල්වා සරහන ලද මණ්ඩපයෙහි උතුම් වූ පර්යංකයක් අතුට දුන්නේය.

(ලකුණු 12 (8+4)

ආ) පහත සඳහන් පද්‍යයන්හි අර්ථය ලිහිල් බසින් ලියා, කවියාගේ වර්ණනා චාතුර්යය පිළිබඳ කෙටි විවරණයක් කරන්න.

සුරරද සමන් සමගින් සුරඟන එව ර
පැහැනද මදාරා පරසතු මල් පත ර
කර පුද වඳින රැඳි මුනි සිරිපා තඹ ර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහි ර

ගනේ මිණි බැබළි කිරණෝ'ව් සත පාය
රනේ යටග සැවුළිඳු දද ගල පාය
අනේ ලකර කළ පුර අප නර පාය
පෙනේ දකුණ මහසෙන් දෙව්රද පාය

වළඳින අදහසින් මෙන් සුරගඟ අඟ න
තල බල සසල දළ රළ පෙළ නුබ නැගෙ න
වෙලලස ගැවසි මුතු සක් පබළු බබල න
බල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙ න

සන් නන් සිහින් ගෙඳි සෙවණලූ වැලිතෙලෙ න
තැන් තැන්වලම සැතපී සියුමැලි බැව් න
රන්වන් කරල් ගෙන එන ගිරවුන් අති න
යන් මන් තොසින් මඟ තොරතුරු නියම දැ න

(ලකුණු 12 (8+4)

## II කොටස

02. ජාතකකථාකරුවා ස්ත්‍රිය විෂයෙහි ප්‍රකට කළ දෘෂ්ටිය කවරාකාර වී දැ'යි නිර්දිෂ්ට ජාතකකථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

03. "සැළලිහිණි සන්දේශය, තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මනාව ප්‍රකට කරන්නකි." නිදසුන් දෙමින් පිරික්සන්න.

04. කුරුණෑගල යුගයේ සාහිත්‍ය කෘතිවලින් ප්‍රකට වන සුවිශේෂ ප්‍රවණතා මොනවාදැ'යි සනිදර්ශන ව විභාග කරන්න.

05. "ගම්පොළ යුගය වනාහි සිංහල සාහිත්‍ය යුගාවලියෙහි ප්‍රධාන හැරවුම් ලක්‍ෂ්‍යයකි." හේතු සාධක දක්වමින් සාකච්ඡා කරන්න.

නැතහොත්

විවිධත්වයෙන් හා විචිත්‍රත්වයෙන් යුක්ත පද්‍ය නිර්මාණ රාශියක් බිහිවීම කෙරෙහි, කෝට්ටේ යුගයේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලනික පසුබිම තුඩු දුන් ආකාරය කෙබඳුදැ'යි පැහැදිලි කරන්න.

## III කොටස

06. විවිධ නිර්වචන කෙරෙහි සාවධාන වෙමින් භාෂාවක ස්වභාවය කෙබඳුදැ'යි විග්‍රහ කරන්න.

07. ශබ්දෝච්චාරණ ඉන්ද්‍රිය පන්තියේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරමින්, භාෂණ සිංහලයේ ශබ්දමාලාව විභාග කර දක්වන්න.

නැතහොත්

සිංහල භාෂාද්විරූපතාව වඩාත් තීව්‍ර වීමෙහි ලා බලපෑ ප්‍රධාන හේතු සාධක මොනවාදැ'යි නිදසුන් දෙමින් පරීක්ෂා කරන්න.

08. ප්‍රාස්තාවික භාෂා සහ පරිමිත භාෂා යන ව්‍යවහාර හඳුන්වා දී ඒවායේ අනන්‍යතා ලක්ෂණ පරීක්ෂා කරන්න.

09. භාෂාව හා සමාජය අතර පවත්නා සම්බන්ධතාව නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.

i. උපභාෂා බිහිවීමෙහි ලා බලපාන සාධක
ii. ප්‍රාදේශීය උපභාෂා
iii. භාෂාව හා සංස්කෘතිය
iv. ව්‍යවහාර සිංහලයේ නියෝජ්‍ය නාම
v. සිංහලයේ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය රටා

(අංක 02 සිට 10 දක්වා පිළිතුරුවලට ලකුණු 19 බැගින්)

**********************************